153379

# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 302/12 — 1978 පෙබරවාරි 01 වැනි බදාදා — 1978.02.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත**

2 වන වගන්තිය යටතේ නියමය

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය, එඩ්වඩ් ලයනල් සේනානායක වන මම, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව—

(1) මෙහි පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති කාර්ය සඳහා පිහිටුවන ලද කෘෂිකාර්මික ව්‍යාපාරය, මේ නියමය අදාළ වන කෘෂිකාර්මික ව්‍යාපාරය ලෙස නිශ්චය කරමි ;

(2) ඉහත කී කෘෂිකාර්මික ව්‍යාපාරය පිහිටුවීමේ සහ පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා සංස්ථාවක් පිහිටුවිය යුතු යයි ප්‍රකාශ කරමි ;

(3) එම සංස්ථාවට ''කෘෂිකාර්මික විවිධාංගකරණ සහ ජනාවාස ජාතික අධිකාරිය'' යන සංස්ථා නාමය පවරමි ;

(4) සංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් කෝටියක් විය යුතු යයි නිශ්චය කරමි ;

(5) සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය මහනුවර විය යුතු යයි සඳහන් කරමි ;

(6) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව හත්දෙනකු විය යුතු යයි නියම කරමි ;

(7) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති තැනැත්තන් පත් කරමි ;

(8) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙස පී. බී. ගුණතිලක මහතා පත් කරමි.

ඊ. එල්. සේනානායක,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය.

1978ක් වූ ජනවාරි මස 12 වන දින,
කොළඹ දී ය.

**පළමුවන උපලේඛනය**

කෘෂිකාර්මික ව්‍යාපාරය පහත දක්වෙන කාර්ය සඳහා පිහිටුවනු ලැබේ :—

(1) කෘෂිකාර්මික විවිධාංගකරණය, ජනාවාස සංවර්ධනය සහ පූර්ණ සම්බන්ධිත දිය බෙත්ම කළමණාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ ආණ්ඩුවේ නැතහොත් ආණ්ඩුවේ නොවන නියෝජිත ආයතන මගින් හෝ එම සැලසුම් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම ;

(2) සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියලු ඉඩම්, උපරිම පලදාව, පරිසරය රැකීම, ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය සහ ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම ;

(3) කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම ;

(4) කෘෂිකාර්මික විවිධාංගකරණය සහ ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(5) (1) වන ඡේදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගකරණය, ජනාවාස සංවර්ධනය සහ දිය බෙත්ම කළමණාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියලු පියවර ක්‍රියාත්මක කිරීම.

**දෙවන උපලේඛනය**

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් :—

(1) පුංචි බංඩා ගුණතිලක මහතා (සභාපති),
(2) සෙනරත් බංඩා පිලපිටිය මහතා (සාමාජික),
(3) සංක ගනේගොඩ මහතා (සාමාජික).

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි